# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1505/15 – 2007 ජූලි 11 වැනි බදාදා – 2007.07.11

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

විධාන අංක 12.

### 2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත

10 (1) (ආ) (II) වගන්තිය යටතේ විධානය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 10 (1) වැනි වගන්තිය යටතේ ක්‍රියා කරමින් මෙහි පහත උපලේඛනයේ දැක්වෙන කලින් ඇසුරුම් කළ භාණ්ඩ, අයිතමයන් හා නිෂ්පාදන සම්බන්ධ සියලුම ආනයනකරුවන්, සැපයුම්කරුවන්, නියෝජිතයන්, බෙදාහරින්නන් හා වෙළෙන්දන් විසින් එම භාණ්ඩ හෝ නිෂ්පාදන දිවයිනට ඇතුළුවන ස්ථානයේ දී එම භාණ්ඩ මත ඉංග්‍රීසි භාෂාවෙන් එම භාණ්ඩයට අදාළ "උපරිම සිල්ලර මිල " ("Maximum Retail Price"), නිෂ්පාදකයාගේ, සැපයුම්කරුගේ, ආනයනකරුගේ හෝ බෙදාහරින්නාගේ නම සහ ලියාපදිංචි කළ ලිපිනය පැහැදිළිව සඳහන් කර තිබිය යුතු ය.

භාණ්ඩ උපලේඛනය

| | |
|---|---|
| රස කැවිලි (චුයින්ගම් ඇතුළුව) | සංයෝජිත වර්ගීකරණ අංකය (HS Code) 1704 |
| චොකලට් | සංයෝජිත වර්ගීකරණ අංකය (HS Code) 1806 |
| බිස්කට් | සංයෝජිත වර්ගීකරණ අංකය (HS Code) 1905 |
| කේක් | සංයෝජිත වර්ගීකරණ අංකය (HS Code) 1905 |
| සුවඳ සබන් | සංයෝජිත වර්ගීකරණ අංකය (HS Code) 3401 |

මෙම විධානය 2007 ඔක්තෝබර් මස 01 දින සිට බලපැවැත්වෙනු ඇත

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

සරත් විජේසිංහ,
සභාපති.

2007 ජූනි මස 29 වැනි දින,
පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය,
අංක 27, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

07 – 521

1A-PG 000805- 690 (2007/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.